www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයට එරෙහිව වොෂින්ටනයේ සාපරාධී යුද්ධය එහි තෙවැනි වසර කරා පිය නගයි

## Washington's criminal war against Iraq enters its third year

**කර්තෘ මන්ඩලය විසිනි**
**2005 මාර්තු 19**

අද දිනෙන් ඇමරිකාව ඉරාකයට කඩා වැදීමේ තෙවැනි වසර ආරම්භ වන්නේ දෙරටෙහිම ජනතාව කෙරෙහි ඇති කල ඛේදජනක පලවිපාක තවත් වැඩි කරමින් ය.

ඇමරිකානු ගුවන් ප්‍රහාරවලින් අලු දූලි වී ගිය, මාර්ග බාධකවල දී වෙඩිතබා මරා දමන ලද හෝ පසු ගිය නොවැම්බරයේ දී ෆලූජාවල දී ක්‍රියාවට නැංවූ ආකාරයේ කෲර ලෙස කොටු කර ඝාතනය කරන ලද ඉරාකීයයන් දස දහස් සංඛ්‍යාවකි.

අනතුරට පත් ඇමරිකානුවන්ගෙන් මරුමුවට පත් වූවන් 1520 ඉක්මවන අතර 11,200ක් හමුදා භටයන් තුවාල ලබා ද ඉරාකයේ දී තමන් දුටු මනුෂ්‍ය සංහාරයේ ප්‍රතිඵලයක් ලෙස මානසික සෞඛ්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන 100,000ක් ද වශයෙන් ඉහල නැංවී තිබේ.

ඉරාක ප්‍රතිරෝධයේ ගින්න නිවා ලීමට හෝ බැග්ඩෑඩයේ නගර මධ්‍යය වත් ආරක්ෂා කර ලීමට පවා 150,000ක් වන ඇමරිකානු ආක්‍රමනික හමුදාව අසමත් වී ඇති බව ඔප්පු වී තිබේ. ඝාතනයන් නැවැත්වීම කෙසේ වෙතත් ඒවා අඩු කෙරෙමින් තිබෙන බවක ඇඟවීමක් පවා නැති අතර ඇමරිකානු දේශපාලන සහ හමුදා නිලධාරීන් ඊටත් එහා නොගියත් දශකයක් තරම් වත් දිග්ගැස්සුනු යටත් කිරීමක් පිලිබඳව කතා කරති. දශ ලක්ෂ ගනනකට රැකියා නොමැතිකමින් ද විදුලිය, ජලය සහ සනීපාරක්ෂාව වැනි මූලික පහසුකම් සුන් වී යෑමෙන් ද ප්‍රචන්ඩත්වයේ අනතුර නිරන්තරව පවතිද්දී ඉරාක ජනයාගේ තත්වය එලෙසින් ම විපත්ති දායකව පවතී.

එසේ නමුදු, මුසාවාද මත පදනම්ව ප්‍රකෝප කරනු නොලැබූ යුද්ධයක් දියත් කිරීම සම්බන්ධයෙන් බුෂ් පරිපාලනය නිදොස් කිරීමට ද ඉරාකයේ පමනක් නොව මැද පෙරදිග පුරාම ප්‍රජාතන්ත්‍රවාදය පෙරට ගෙන යාම පිලිබඳව ඇමරිකානු මිලිටරිවාදයට සම්මාන පිදීමට ද ඇමරිකානු මාධ්‍ය තුලින් මෙන්ම මවා පෙන්වන ඩිමොක්‍රැටික විරුද්ධ පක්ෂය තුලින් ද නැගෙන ඝෝෂාව වැඩි වෙමින් තිබේ. ඉරාකය සතු ජනඝාතක අවි සහ අල්කයිඩා ත්‍රස්තවාදීන්ට ඇති සබඳතා පිලිබඳව බුෂ් පරිපාලනයේ මුසාවාද මතින් නැගී ගත් ඉරාකය යටත් කිරීම කලාපය පුරාම ජනතාව තුල උද්යෝගය දල්වා ලූ ප්‍රජාතන්ත්‍රීකරනයේ ව්‍යායාමයක් ලෙස කියා පෑම ඒ සියල්ල අතුරින් ලොකුම ප්‍රෝඩාවයි.

ඉරාකයේ ඇමරිකානු මැදිහත්වීම ප්‍රජාතන්ත්‍රවාදය නොව සාපරාධීත්වය පිලිබඳ නිදර්ශනයකි. එය සිදු කිරීමට අවකාශ සැලසුනේ කම්කරු ජනතාව සහ ඩිමොක්‍රැටික් සහ රිපබ්ලිකන් යන පක්ෂ දෙකම පාලනය කරන්නා වූ මූල්‍ය කතිපයාධිකාරය අතර පෙර නුවූ විරූ ආකාරයේ සමාජ ධ්‍රැවාන්තගතවීම තුල මුල් බැස ගත්තා වූ එක්සත් ජනපදය තුල ම ප්‍රජාතන්ත්‍රවාදී ඓතිහාසික බිඳ වැටීම තුලින් ය.

මහජන මතය මර්දනය කිරීම තුලින් අටවනු ලැබූ බුෂ් පරිපාලනය බලයට පැමිනියේ ඒ වනවිටත් සූදානම් කර තිබූ ඉරාකය විජිතකරනයේ සැලසුම් අතැතිව ය. ඔවුහු 2001 සැප්තැම්බර් 11 දා ත්‍රස්තවාදී ප්‍රහාරයන් මෙම සැලසුම ක්‍රියාත්මක කිරීමට නිමිත්ත ලෙස යොදා ගත්තෝ ය. ඇමරිකානු ජනතාව ත්‍රස්ත කිරීමෙන් යුද්ධය ඔවුන් මත පැටවීමේ ප්‍රයත්නයනට, පරිපාලනයේ අමූලික බොරුවලට කිසිදු බැරෑරුම් අභියෝගයක් ඉදිරිපත් කිරීමට අසමත් වූ ඩිමොක්‍රැටික් පක්ෂය සහ මාධ්‍ය තුලින් පහසුකම් සලසනු ලැබුනි.

තෙල් සම්පත් අල්ලා ගැනීමටත් ගෝලීය ආධිපත්‍යය සඳහාත් ඊනියා පූර්වභංග යුද්ධය සහ ඇමරිකානු මිලිටරි ශක්තිය යොදාගැනීම ඇමරිකානු පාලක ප්‍රභූවේ ඒකමතික පිලිවෙත බවට තිබෙන පැහැදිලිම සාක්ෂ්‍යය මාධ්‍යයේ හා ඩිමොක්‍රැටිකයන්ගේ මෙම ඒකඟතාව යි.

2003 මාර්තු 19 වැනි දිනය සැබැවින්ම අපවාදයේ දිනය යි. ලෝක ගෝලයේ මුහුනත මත විශාලතම අධිරාජ්‍යවාදී බලවතා වන එක්සත් ජනපදය තමන්ට කිසිදු ආකාරයකින් තර්ජනයක් නොවූ ද අනාරක්ෂිත වූද ජාතියකට විරුද්ධව සාහසික ලෙස ජාත්‍යාන්තර නීතිය උල්ලංඝනය කරමින් සිය මුලු මිලිටරි බලය යෙදෙව්වේ ය.

මෙම ආක්‍රමනයේ සාපරාධී ස්වභාවය ඉරාකය තුල ඇමරිකානු ක්‍රියාත්විතයන්ගේ සියලු අංශ තුලට පිලිකාවක් ලෙස විහිදී ගියේ ය. මැද පෙරදිග, අප්‍රිකාව, ආසියාව සහ ලොව අනෙකුත් පීඩාවට පත් කලාප තුල යටත්විජිත යුද්ධ සහ ඇඳාගැනීම් සමග බැඳුන සියලු අපරාධයන් එමගින් දැවැන්ත පරිමාවකින් ප්‍රතිනිර්මානය කලේ ය.

ඇමරිකානු මිලිටරිය අද අඩු තරමේ ඉරාක ජාතිකයන් 10,000ක් වත් කිසිදු නිශ්චිත චෝදනාවකින් හෝ තොරව රඳවා තිබෙන සිර කඳවුරු ජාලයක් පවත්වා ගෙන යයි. පසුගිය වසරේ අබු ග්‍රයිබ් සිර ගෙදර සිදු කල වධ දීම් සහ අපචාරයන් සහිත ඡායා රූප මගින් අවුලුවා ලූ කෝපය හා ලජ්ජාව ජන මාධ්‍යයන් විසින් යට ගසනු ලැබූ අතර ඊට ද වඩා දරුනු අපරාධ වෙත ඉඟිකරන තොරතුරු දිගටම එලිදරව් වෙමින් තිබේ.

තමන් ඉරාකයේ සහ ඇෆ්ඝනිස්තානයේ සිරගත කොට සිටි 108 දෙනකු ජීවිතක්ෂයට පත්වීම පිලිබඳව පෙන්ටගනය ම දැන් පිලිගෙන ඇති අතර වැඩිදෙනෙක් මිය ගොස් ඇත්තේ ප්‍රචන්ඩත්වයෙනි. අඩුම තරමින් මරනවලින් හතරෙන් පංගුවක් වත් විමර්ශනය කරනු ලැබ ඇත්තේ මනුෂ්‍ය ඝාතන ලෙසින් ය. සමහර සිද්ධිවල දී රැඳවියන්ට දිගු කලක් තිස්සේ මැරෙනතුරු වධ දීම හෝ පහර දීම සිදුව තිබේ. මේ තරම් දේ ප්‍රසිද්ධියට පත්ව තිබේ නම්, මිලිටරි රහස්‍යභාවයේ තාප්පය පිටු පස විශාල පරිමානයේ අපරාධයන් තවම සැඟවී තිබෙනු ඇතැයි විශ්වාසයට ගත හැකි ය.

සිතා මතා ම සිවිල් ජනතාව ඉලක්ක කර ගැනීමත් ඇමරිකානු මිලිටරිය විසින් සමූහ දන්ඩනයට ලක් කිරීමත් තුලින් ඉරාක ජනතාව යුද අපරාධයන්ට ලක්ව ඇත. ෆලූජා යන වචනය ද කෲරත්වයට සමගාමී පදයක් ලෙස වෝර්සෝ ගෙටෝව, ගුවෙර්නිකා, ලීඩිස් සහ මයිලායි සමග ඉතිහාසයේ එක පෙලට සටහන් වනු ඇත.

එක්සත් ජනපද මිලිටරි වැටලීම මගින් දල වසයෙන් නගරයේ 300,000ක් පදිංචිකරුවෝ ඔවුන්ගේ නිවාසවලින් පලවා හරිනු ලැබූහ. මෙම වසර මුල දී අනාථයන් සඳහා වන එක්සත් ජාතීන්ගේ කොමිසම (යූඑන්එච්සීආර්) නිකුත් කල වාර්තාවකට අනුව ඔවුන්ගෙන් 85,000ක් දෙනා ඇමරිකානු මිලිටරි කපොලු හරහා ආපසු පැමිනියත් රාත්‍රියේ නගරය තුල රැඳී සිටියේ 3,000ක් තරම් සුලු කොටසකි. අතිමහත් බහුතරයකගේ නිවාස සුන්බුන් වී තිබූ අතර නගරයේ විදුලිය ජලය සෞඛ්‍ය පහසුකම් සියල්ල කපා හැර තිබුනි. ෆලූජා පිලිබඳ යූඑන්එච්සීආර් වාර්තාවේ සම්පින්ඩනයකට අනුවඃ ''ගොඩනැගිලිවලින් සියයට 40ක් මුලුමනින් ම විනාශ වී ද, සියයට 20කට විශාල ලෙස හානි වී ද, සියයට 40කට සැලකිය යුතු තරම් හානි වී ද තිබේ.''

සුන්බුන් අතරින් තවමත් මල කඳන් ගොඩ ගන්නා බව ඇසින් දුටුවෝ වාර්තා කරති. සමහරු ඇමරිකානු මැරීන් හටයන් ගෙයින් ගෙයට කල කඩාපැනීම්වල දී නිරායුධ පවුල් සාමාජිකයන් සංහාරය කල අයුරු පවසන අතර දිවි ගලවා ගත් අය නගරයේ තොග ගනනේ සිදු වූ ඝාතනයන්ගෙන් මානසික කම්පනයට පත්ව සිටිති.

ඉන්ටර් ප්‍රෙස් සර්විස් සඳහා ලියන ඩාර් ජමායිල් 16 හැවිරිදි ගැහැනු ලමයකුගේ සාක්ෂිය උපුටා දක්වයිඃ

''ඇය දින තුනක් තිස්සේ සිය නිවස තුල මරාදැමුනු ඇගේ පවුලේ අයගේ මල සිරුරු සමග ගත කලා ය. සොල්දාදුවන් නිවසට ඇතුල්වන විට ඇය පියා, මව, 12 වියැති සොහොයුරා සහ සොහොයුරියන් දෙදෙනා සමග සිටියා ය.

''සොල්දාදුවන් පැමින කිසිවකුත් නොකියා අගේ මවට හා පියාට වෙඩි තබනු ද ඇගේ සෝයුරියන් දෙදෙනාට පහර දී හිස්වලට වෙඩි තබනු ද ඇය බලා සිටියා ය. මෙයින් කෝපයට පත්ව සොල්දාදුවන් වෙතට කෑගසමින් දිව ගිය ඇගේ සොහොයුරාට ද ඔවුන් වෙඩි තබා මරා දැමූහ.''

ඝාතනය දිගටම සිදු වෙයි. එක්සත් ජනපද හමුදාවන්ට පමනක් නොව කුලී හමුදාවකට ද - දකුනු අප්‍රිකාව හා චිලිය වැනි රටවල ෆැසිස්ට් ඝාතක කන්ඩායම්වල ප්‍රවීනයන් මෙහි සිටින්නේ සුලු වශයෙන් නො වේ - තර්ජනයක් විය හැකි යැයි පෙනෙන ඕනෑම ඉරාක මිනිසෙකු ගැහැනියක හෝ ලමයකු මරා දැමීමට බලපත්‍රයක් තිබේ. එක්සත් ජනපදය සංවිධානය කල ඉරාක මිලිටරියේ ඉහල ජෙනරාල්වරයෙකු මේ සතියේ මාර්ග බාධකයකදී ඇඳිරිනීතිය කඩ කිරීම හේතුවෙන් වෙඩි තබා මරා දැමීම මෙම ප්‍රචන්ඩත්වය පැතිරී ගොස් ඇති තරම පෙන්නුම් කර දෙයි.

## දැවැන්ත දූෂන

ඝාතනයන් සමග එක පෙලට ඉරාකය දේශපාලන සබඳතා ඇති මිලිටරි කොන්ත්‍රාත්කරුවන්ගේ මහා පරිමාන දූෂනයේ සහ මංකොල්ලයේ දර්ශන තලයක් වී තිබේ. සාපරාධී යුද්ධයකින් ඉරාකය තුල හොරු රංචුවක් මුදා හැර තිබේ.

පෙන්ටගන් විගනන නිලධාරීන්ගේ මෑත වාර්තාවක උප ජනාධිපති ඩික් චේනි කලින් ප්‍රධානියාව සිටි හැලිබර්ටන් සමාගම ඉරාකයට ඉන්ධන ආනයනය කිරීමේ දී ඇමරිකානු ආන්ඩුවෙන් ඩොලර් මිලියන 108ක් වැඩිපුර අය කිරීම පිලිබඳව චෝදනා කර තිබේ.

කුවේටයෙන් ඔවුන් ඩොලර් 82,000කට මිලට ගත් ද්‍රවීක්ෂත පෙට්‍රෝලියම් ගෑස් ප්‍රවාහනයට සමාගම ඩොලර් මිලියන 27ක් අය කල සිද්ධියක් ද මෙයට ඇතුලත් ය. ඔක්තෝබර් වන විට විගනනය අවසන්ව තිබූ නමුත් නොවැම්බර් මැතිවරනය හමාරවන තුරු

පරිපාලනය එය රහසක්ව තබා ගත්තේ ය.

හැලිබර්ටන් සමූහයේ අනු සමාගමක් වන කෙලොග් බ්‍රවුන් ඇන්ඩ් රූට් (කේබීආර්) සේවකයකු මේ සතියේ දී චෝදනාවට ලක් වූයේ තෙල් නැව් සඳහා කුවේට් කොන්ත්‍රාත්කරුවකුට ඩොලර් මිලියන 5කට ආසන්න මුදලක් වැඩිපුර ගෙවූ ටෙන්ඩර් මගඩියක් හේතුවෙනි. මෙම ගනුදෙනුව යටගැසීම සඳහා ඩොලර් මිලියනයක අල්ලසක් ලබා ගැනීම කේබීආර් සේවකයාට විරුද්ධව නැගුනු චෝදනාව යි. හිටපු ලෝක බැංකු නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන සුපරීක්ෂන කන්ඩායමක් වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ට නැෂනල් හි මෑත වාර්තාවක,''ඉරාකය ඉතිහාසයේ විශාලතම දූෂන මගඩිය'' වනු ඇතැයි අනතුරු ඇඟවී ය.

රුධිරය හා කැලිකසලින් යුතු එවන් නරකාදි කොන්දේසි අරාබි ලෝකයේ අනෙක් පලාත්වල වසන ජනයා විසින් ආදර්ශයට ගතයුතු යැ යි පැවසීම එක්වන්ව ම විපරීත ද අශික්ෂිත ද වන්නේ ය.

ජනවාරි 30 දා පැවැත්වූ ඉරාක මැතිවරනය බුෂ් පරිපාලනයේ පිලිවෙත් නිදොස් බව ඔප්පුවීමක් යැයි ද එය කලාපයට ආශ්වාදයක් යයි කියා පෑම තව දුරටත් ඇදහිය නොහැක්කකි. පලමුවෙන් ම සිහිපත් කර ගත යුතු වන්නේ, ඇමරිකානු යටත්විජිත අධිකාරියට ආවරනයක් ලෙස රූකඩ ඉරාක ආන්ඩුකවුන්සිලය පිහිටුවූ වොෂින්ටනය මත මෙම ඡන්දය බලෙන් පැටවුන එකක් බව ය. පසුගිය වසන්තයේ දැවැන්ත ෂියායිට් පෙලපාලිවලට මුහුන දුන් ඇමරිකානු නිලධාරින් පැකිලෙමින් චන්දයට එකඟ වූයේසන්නද්ධ ප්‍රතිවිරෝධය පැතිරීයාම වලක්වාගනු වස් ය.

වැඩිම ජයග්‍රහනය ලැබුවෝ වන්නේ ඉසලාමීය නීතිය බලගැන්වීම අරමුනු කරගත් ෂියයිට් පූජකයන්ට සම්බන්ධිත දේශපාලන පක්ෂ සහ බහුවාර්ගික කර්කුක් නගරය සහ එහි තෙල් බිම් ද ඇතුලත් උතුරේ අර්ධ-ස්වයංපාලිත ජනවාර්ගික ප්‍රදේශයක පාලනය තහවුරු කර ගැනීමට අදිටන් කර ගත් කුර්දි නායකයින් ය. ඉරාකය මුහුන දෙන සංකීර්න ඓතිහාසික ගැටලුවලට මෙම සූත්‍රය ප්‍රජාතන්ත්‍රීය විසඳුමක් ලබා දෙන්නේ නැත.

මෙම මැතිවරනයෙන් මතුව ආ පාර්ලිමේන්තුවට තවමත් ආන්ඩුවක් පිහිටුවිය නොහැකිව තිබෙන අතර කිසිදු බලාධිකාරයක් ද එයට නැත. ප්‍රහාරක හෙලිකොප්ටර් සැරිසරන ගුවන් තලයකින් ද දැඩි ලෙස ආරක්ෂිත ඇමරිකානු පාලිත හරිත කලාපයේ පැවැත්වුන ආරම්භක පාර්ලිමේන්තු සැසිය තුල බලවේගයන්ගේ සැබෑ සබඳතාවයන් පෙන්නුම් කෙරින.

ඉරාක මැතිවරනය මැද පෙරදිග ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයකට මග සලසන ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහනයක් නියෝජනය කරන්නේ ය යන මිථ්‍යාව ප්‍රචාරනය කිරීම ඉරාක යුද්ධය ඇමරිකානු මිලිටරි ආක්‍රමනශීලිත්වයේ ඉදිරි ක්‍රියාවන්ට පූර්විකාවක් පමනක්ය යන අනතුරු ඇඟවීම ගෙන එයි. තමන් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ද ''කුරිරු පාලනය '' ට එරෙහිවද ගෝලීය අරගලයක නිරතව සිටින්නේ යැයි බුෂ් පරිපාලනය මෑතකදී කළ ප්‍රකාශයන් සමග මෙය බැඳී පවතී. වොෂින්ටනය විසින් ඉලක්ක කරනු ලබන කෲර පාලකයන් එක්කෝ සැලකිය යුතු බලශක්ති සම්පත් පාලනය කරයි- ඉරානය සහ වෙනිසියුලාව- නැතිනම් බලශක්ති නිෂ්පාදන කලාපවල මූලෝපායික ස්ථානයන්හි පිහිටා සිටියි, එසේත් නැතහොත් අමෙරිකාවේ අර්ථික තරගකරුවන් වෙත තෙල් හෝ ගෑස් නැව්ගත කරන මාවත ඔස්සේ පිහිටා සිටියි යන කාරනය මුලුමනින් ම බැහැර කල නොහැක. තෙල් සහ මිලිටිරි කඳවුරු සම්පාදනය කරමින් එක්සත් ජනපදයේ සේවාදයක රාජ්‍යයන් ලෙස ක්‍රියා කරන පර්සියානු බොක්කේ ඒකාධිපති පාලන තන්ත්‍රයන් සත්තකින් ම මෙම ලැයිස්තුවෙන් ඉවත තබා ඇත.

අමෙරිකානු ජනතාවගෙන් බහුතරය ඉරාකයේ යුද්ධයට විරුද්ධ බවට ඇති තරම් සාක්ෂි තිබෙන අතර ''කුරිරු පාලනයන්ට'' එරෙහිව සටන් කිරීමේ නාමයෙන් මැද පෙර දිග තුල කොල්ලකාරී අමෙරිකානු මැදිහත්වීම පලල් කිරීමට ඊටත් වඩා සතුරු බවද ඔප්පු වී තිබේ.

වොෂිංටන් පෝස්ට් සහ ඒ බී සි නිවුස් මගින් මෑත දීම පැවැත්වූ මත විමසුමකදී යුද්ධයට සහභාගි වීම පලක් නැතැයි සියයට 53ක් පැවසූ අතර සියයට 70ක් 1500ක් වූ එක්සත් ජනපදයේ හමුදා මරන පිලිගත නොහැකි මිලක් ලෙස විශ්වාස කරති. මත විමසුමට සහභාගී වූ විශාල බහුතරය ලෝකය තුල ඇමෙරිකාව දරන තැන සහ ඊට ඇති පිලිගැනීම යුද්ධය නිසා හානියට පත්ව ඇතැයි පැවසූ හ.

වැදගත්ම කාරනය නම් යුද්ධයට ඇති මේ පුලුල් විරෝධය සංගත පාලිත මාධ්‍ය තුලමත් ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වය තුලමත් කිසිසේත්ම ප්‍රකාශටය පත් නොවීම යි. විරුද්ධත්වය වර්ධනය වූයේ නායකත්වයකින් තොරව හා නිමක් නැති දේශප්‍රේමී උද්ඝෝෂනයක් දත් ඇඳි අතර ය.

නියෝජිත මන්ත්‍රී මන්ඩලය යුද්ධය ගෙන යාම සඳහා ඩොලර් මිලියන 81.4ක් ''හදිසි'' අරමුදලක් අනුමත කලේ පසුගිය බදාදා ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ අති බහුතරයක් පරිපාලනයට සහයෝගය දීම නිසා මෙම විධි විධාන 388ට 43 ක් තරම් වැඩි ඡන්දයකින් සම්මත විය. ''ත්‍රස්තයට එරෙහි යුද්ධය ජය ගැනීමේ අපගේ මූලෝපාය'' සඳහා වන ''ශක්තිමත් ද්වීපාක්ෂික සහයෝගය'' ප්‍රදර්ශනය කිරීමක් ලෙස බුෂ් මෙය අගය කලේ ය.

ඉරාක යුද්ධය වෙනුවෙන් දැනට ඇමෙරිකාව මසකට ඩොලර් බිලියන 5කට ආසන්නව වියදම් කරයි. මේ සමගම, බ්‍රස්පතින්දා සෙනට් මන්ඩලය ඩොලර් බිලියන

134කින් පොහොසතුන්ගේ බදු කපා හැරීම අනුමත කරන අතර වාරයේ ආන්ඩුව වෛද්‍යාධාර සහ අනෙකුත් මූලික සහන වල දැවැන්ත කප්පාදු කිරීම් සූදනම් කරයි.

විදේශයන්හි ප්‍රජාතන්ත්‍රවාදය පතුරවාහැරීම වෙනුවට ඉරාක යුද්ධය එක්සත් ජනපදය ඇතුලත ම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් විනාශ කිරීම උග්‍ර කරවයි. ස්වදේශ ආරක්ෂක දෙපාර්තුමේන්තුව, දේශ ප්‍රේමී පනත, මිලිටරි උසාවි, ''සතුරු සටන් කරුවන් අල්ලා ගැනීම සහ නිමක් නැති කලකට රඳවා තැබීම අභ්‍යන්තර ඔත්තු බැලීම් හා රහස්‍ය පරීක්ෂන පුලුල් කිරීම ආන්ඩුවේ රහස්‍ය භාවය පලල්වීම සහ අනෙකුත් විධි විධානයන්ගේ ස්වරූපයෙන් පොලිස් රාජ්‍යයක යටිතල ව්‍යුහය සම්පාදනය කර ගොඩනගා තිබේ.

යුද්ධය කම්කරු පන්ති ජනතාවන් මූල්‍ය ප්‍රභූවෙන් වෙන් කෙරෙන සමාජ ආගාධය තවදුරටත් පලල් කරයි. ජීවන තත්වයන් කබාසිනියා කිරීම සහ කම්කරු පන්තික තරුනයන් මැරීමට ද මරනු ලැබීමට ද දැක්කීම මගින් මෙම පැලැන්තිය යුද්ධයේ මාර්ගයෙන් තමන්ගේ ම අවශ්‍යතාවයන් සරිකරගන්නා අතර මිලිටරිවාදයේ සම්පූර්න බර ඇමරිකානු කම්කරුවා මතට පටවයි.

යුද්ධය අවසන් කිරීම සඳහා වන පලල් මනෝගතියට සහ සමාජ අසමානතාවය පිලිබඳව වැඩෙන කෝපය පිට කිරීමට තැනක් ඇමරිකාවේ ද්විපක්ෂක ක්‍රමයේ තුලින් සොයාගත නොහැකි ය. යුද්ධයට එරෙහි අරගලය පෙරට ගෙන යා හැක්කේ කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය තහවුරු කිරීමේ මාවත ඔස්සේ පමනකි. මෙහි දී ඇමරිකානු සමාජය විප්ලවකාරී ලෙස පරිවර්තනය කිරීම සඳහා වන දැවැන්ත සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීම අවශ්‍ය කැරී තිබේ.

ඉරාකය තුල යුද්ධයේ දෙවන සංවත්සරයේ දී සමාජවාදී සමානතා පක්ෂය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මිලිටරිවාදයේ සහ යුද්ධයේ වසංගතය අවසන් කිරීමට ඇමරිකාවේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට තමන් දරන වෑයම තීව්‍ර කිරීමටත් පෘථුල කිරීමටත් පිලින දෙති.

© www.wsws.org